# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 3 ශ්‍රේණිය - පරිසරය (නොවැම්බර්-4 සතිය)

## 15 තේමාව - මිනිසා හා තොරතුරු

දුවේ පුතේ හිස් ටින් එකකින් හෝ ඔබගේ ළඟ ඇති සෙල්ලම් බෙරයක් සකස් කරගන්න.

- බෙරයට කෝටුවකින් හෝ අතින් හෝ ගහලා ශබ්දය එනවාදැයි බලන්න.
- දැන් ඔබ අණ බෙරකරුවෙකු ලෙස පහත පණිවිඩය කියන්න.

ඩුං ඩුං ඩුං

අසවු අසවු හොඳින් අසවු

අත්‍යාවශ්‍ය දෙයකට හැර

නිවසින් බැහැර නොයවු

නිවසින් පිට යන්න වුණොත්

මුඛ ආවරණ පැළඳ ගනිවු

පිටගොස් නිවසට ආවොත්

දෑත් දෙපා ඇඳුම් සැවොම

සබන් යොදා සෝදා ගනිවු

ඩුං ඩුං ඩුං

- ඔබ පණිවිඩයෙන් කියූ දේ ගෙදර ඉන්න අයගෙන් අහන්න.

මේ ප්‍රශ්න වලට ඔබ පිළිතුරු සපයන්න.

1 පණිවිඩය කුමක් ගැනද?

2 නිවසින් බැහැරට යන්න ඕනේ කුමක් සඳහා ද?

3 නිවසින් බැහැර ගියහොත් කුමක් කරගෙන යා යුතුද?

4 නිවසින් පිටතට ගොස් ආපසු එන අප අනිවාර්යෙන් කළයුතු දේ මොනවාද?